12746

AL/2022(2023)/52/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 14 | |
| 03 | 15 - 22 | |
| 04 | 23 - 35 | |
| 05 | 36 - 43 | |
| 06 | 44 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** හස්ත හා පාද චලන හුරු කිරීම සඳහා උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්හි භාවිත සරඹ අභ්‍යාස හඳුන්වනුයේ පිළිවෙළින්,
(1) දණ්ඩි සරඹ, පා සරඹ සහ මණ්ඩි පද යනුවෙනි.
(2) ගොඩ සරඹ, ඉලංගම් සරඹ සහ දොඹින පද යනුවෙනි.
(3) අත් සරඹ, ගොඩ සරඹ සහ දොඹින පද යනුවෙනි.
(4) මණ්ඩි සරඹ, ගොඩ සරඹ සහ ඉලංගම් සරඹ යනුවෙනි.
(5) මණ්ඩි පද, පා සරඹ සහ දණ්ඩි සරඹ යනුවෙනි. (.........)

**2.** 'ව්‍යවහාරික උඩරට නර්තන කලාව' සහ 'උඩරට තාල ශාස්ත්‍රය' යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ පිළිවෙළින්,
(1) තේජා ගුණවර්ධන සහ ජී. රංගනාථ ය.
(2) ජී. රංගනාථ සහ තිස්ස කාරියවසම් ය.
(3) වෛද්‍යවතී රාජපක්ෂ සහ ලයනල් බෙන්තරගේ ය.
(4) මුදියන්සේ දිසානායක සහ ජේ. ඊ. සේදරමන් ය.
(5) මුදියන්සේ දිසානායක සහ වෛද්‍යවතී රාජපක්ෂ ය. (.........)

**3.** භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව රති සහ ජුගුප්සා භාව මගින් ඇති කරවන රස මොනවා ද?
(1) ශෘංගාර සහ බීභත්ස්‍ය (2) වීර සහ රෞද්‍ර
(3) ශෘංගාර සහ අද්භූත (4) ශෘංගාර සහ කරුණ
(5) කරුණ සහ බීභත්ස්‍ය (.........)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4. ජස කෝලම සහාගතවන බෙර පදය වනුයේ,
(1) ගුං දැහිං ගුඳ ගුඳ දැහිං ... ය.
(2) ගත ගුං රිම්ගත ගදිගත ගදිත ගතම් ... ය.
(3) දොම්ත ගතම් දොම්ත ගදිගතම් ... ය.
(4) රෙගත දෙගත ගදිගත ගුං ... ය.
(5) රිම් ගත්තම් ගද්දිත ගත ... ය. (.........)

5. තුන්සුළු මහ සිව්තිත ඇතුළත් වරණය තෝරන්න.
(1) තෙයි තෙයි තෙයි තෙයි
(2) තිත් තිත් තිත් තිත්
(3) තිත් තෙයි තිත් තෙයි
(4) තිත් තිත් තෙයි තෙයි
(5) තිත් තිත් තිත් තෙයි (.........)

6. "දෝං ජිං ජිං තකට දොංතක" යන බෙර පදයට ගැළපෙන හින්දුස්ථානි තාලය කුමක් ද?
(1) ජප්තාල
(2) ත්‍රිතාලය
(3) දාදරා
(4) කෙහෙර්වා
(5) දීප්චන්දි (.........)

7. "රිම් ගත ගත ගදිත ගතම් ගත්දිත් තත් දොම් තකු දොම්" යන පදයෙන් ආරම්භවන ඉරට්ටිය අයත් වන්නේ,
(1) සින්දු මාත්‍රයට ය.
(2) මුල් මාත්‍රයට ය.
(3) ශුද්ධ මාත්‍රයට ය.
(4) යක් පද මාත්‍රයට ය.
(5) ගෙජ්ජි මාත්‍රයට ය. (.........)

8. කයිපුඩි වළල්ල සහිත වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) ගැටබෙරය සහ පහතරට බෙරයයි.
(2) ගැටබෙරය සහ දවුලයි.
(3) තම්මැට්ටම සහ ගැටබෙරයයි.
(4) තම්මැට්ටම සහ දවුලයි.
(5) දවුල සහ උඩැක්කියයි. (.........)

9. "සුගත් දහම් සඟ රත්නේ වඳිල්ලා - ඊගත් සුරන් සැම දෙවි ඇදහිල්ලා" මෙය,
(1) උඩැක්කි කවියකි.
(2) පන්තේරු කවියකි.
(3) මල්යහන් කවියකි.
(4) නෙළුම් කවියකි.
(5) පතල් කවියකි. (.........)

10. කවිකාර මඩුවේ වන්නම් ගායනා සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලැබුණේ,
(1) I රාජසිංහ රජ සමයේදී ය.
(2) II රාජසිංහ රජ සමයේදී ය.
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේදී ය.
(4) ශ්‍රී වීරබාහු රජ සමයේදී ය.
(5) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමයේදී ය. (.........)

11. අට්ටියල්, මුත්තුමාල, කාසිමාල සහ පදක්කම් පලඳිනු ලබන්නේ,
(1) භරත නාට්‍යයම්හිදී ය.
(2) කථක් නර්තනයේදී ය.
(3) කථකලි නර්තනයේදී ය.
(4) මනිපුරි නර්තනයේදී ය.
(5) ඔඩිසි නර්තනයේදී ය. (.........)

12. "ඉසට ඉසලන්ට ජගලත්තු තොප්පියක් - කරට කරලන්ට මුතු බැඳපු මාලයක්"
ඌරා යක්කමේදී මෙම කවිය ගායනා කරමින් **වනං** වෙන්කර දෙන්නේ,
(1) බෙරකාරයාට ය.
(2) යක්දෙස්සාට ය.
(3) ගුරුන්නාන්සේට ය.
(4) ගමරාළට ය.
(5) හේනේමාමාට ය. (.........)

13. වලියක් මංගල්‍යයේදී බැතිමතුන් විසින් පඬුරු ගැට ගසනු ලබන්නේ,
(1) ගවරමලේ ය.
(2) ඒකාවැලේ ය.
(3) උල්උඩේ ය.
(4) සිව්ලි වළංවල ය.
(5) අටමඟලේ ය. (.........)

14. ජස-ලෙන්චිනා කෝලම් හා සම්බන්ධවන අවශේෂ චරිත වන්නේ,
(1) පුරන්සිනා, මුදලි සහ චුක්කිනියා ය.
(2) පුරන්සිනා, මුදලි සහ අප්පුහාමි ය.
(3) මුදලි, හෙන්චප්පු සහ ගුරුහාමි ය.
(4) මුදලි, අප්පුහාමි සහ ඩුංගුරුවා ය.
(5) අප්පුහාමි, පරයා සහ හෙන්චප්පු ය. (.........)

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**15.** සූනියම් යක්ෂණිය, කුමාර පෙළපාළිය සහ පාළි නැටීම යන නර්තනාංග දක්නට ලැබෙන ශාන්තිකර්මය කුමක් ද?
(1) රටයකුම (2) සූනියම් යාගය
(3) සන්නියකුම (4) දෙවොල් මඩුව
(5) පහන් මඩුව (.........)

**16.** දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය හා බැඳි තාල ඇතුළත් වරණය තෝරන්න.
(1) දෙතාලය, අඨතාල සහ ජම්ප තාල (2) ඒකතාල, දෙතාලය සහ දාදරා තාලය
(3) ඒකතාල, තුන්තාල සහ දාදරා තාලය (4) රූපක තාල, මඨ තාල සහ ජප් තාලය
(5) රූපක තාල, මඨ තාල සහ ත්‍රිපුට තාල (.........)

**17.** "දබරේ කරකවන අත් දෙක වෙවුලනවා - නිතර ඇවිත් ලෝඩර දත්මිටි කනවා" යන පතල් කවියෙන් අරුත් ගැන්වෙන්නේ පතල්කරුවාගේ,
(1) යටහත් බවයි. (2) පරාධීන බවයි.
(3) දුක්ඛිත බවයි. (4) වයෝවෘද්ධ බවයි.
(5) අලසකමයි. (.........)

**18.** ගැටබෙර, පනාබෙර, එකැස්බෙර, මිහිඟුබෙර, මද්දල ... ආදි තූර්යභාණ්ඩ නාමාවලියක් සඳහන් ග්‍රන්ථය,
(1) සිංහල ථූපවංශයයි. (2) කව්සිළුමිණයි.
(3) කඳවුරු සිරිතයි. (4) දළදා සිරිතයි.
(5) දඹදෙණි අස්නයි. (.........)

**19.** වලියක් මංගල්‍යයේ භාවිත කරන වෙස් මුහුණ හඳුන්වනු ලබන්නේ,
(1) දළ කඩවර මුහුණ ලෙස ය. (2) ගරා කඩවර මුහුණ ලෙස ය.
(3) රීරි කඩවර මුහුණ ලෙස ය. (4) කළු කඩවර මුහුණ ලෙස ය.
(5) සුදු කඩවර මුහුණ ලෙස ය. (.........)

**20.** පහත රූප මගින් දැක්වෙන ශාන්තිකර්ම චරිතය වන්නේ,
(1) සළු පාළියයි.
(2) නාග සන්නියයි.
(3) දූප පාළියයි.
(4) දේව සන්නියයි.
(5) සූනියම් යක්ෂණියයි.




(.........)

**21.** ගාන්ධර්ව විභාගය සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ආරම්භ කළ වර්ෂ දෙක වන්නේ පිළිවෙළින්,
(1) ක්‍රි.ව. 1930 සහ ක්‍රි.ව. 1952 ය.
(2) ක්‍රි.ව. 1931 සහ ක්‍රි.ව. 1955 ය.
(3) ක්‍රි.ව. 1936 සහ ක්‍රි.ව. 1956 ය.
(4) ක්‍රි.ව. 1943 සහ ක්‍රි.ව. 1960 ය.
(5) ක්‍රි.ව. 1945 සහ ක්‍රි.ව. 1972 ය. (.........)

**22.** නර්තන විලාස පිළිබඳ සැවුල් සංදේශයේ ඇතුළත් කවිය තෝරන්න.
(1) අඳිමින් පටසළු ගෙල සඳුනෙන් තුනුතවරා
(2) රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා
(3) ලෙලවන දිගු නෙත නිලුපුල සේයා
(4) ලකළ පුළුලුකුල බැඳි මිණි මෙවුල්ලා
(5) බරත සතර පෙර ඉසිවර කී ලෙසට (.........)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**23.** සංගීතය හා නර්තනය නිර්මාණාත්මකව යොදාගත්, 21 වන සියවසේ නිෂ්පාදනය වූ දේශීය චිත්‍රපට වන්නේ,
(1) පත්තිනි සහ නිධානය ය. (2) යසෝදරා සහ අංජානා ය.
(3) යසෝදරා සහ අංගුලිමාල ය. (4) කුසපබා සහ අශෝකමාලා ය.
(5) කුසපබා සහ පත්තිනි ය. (.........)

**24.** සුබ, ගණ සහ අක්ෂර සංයෝජනයෙන් ප්‍රබන්ධ කොට ඇතැයි සැලකෙන වාදන විශේෂය තෝරන්න.
(1) අත්‍යා බෙර (2) මඟුල් බෙර
(3) යක් බෙර (4) සමූහ බෙර
(5) වාද බෙර (.........)

**25.** වන්නම් පිළිබඳ 1908 දී ප්‍රකාශිත ප්‍රථම මුද්‍රිත සඟරා ලිපිය රචනා කරන ලද්දේ,
(1) කලවාන ධර්මාලංකාර අතපත්තු මුදලි විසිනි.
(2) තියඹරාවත්තේ ඩී. ඩී. යායින්න විසිනි.
(3) මහවලතැන්නේ බණ්ඩාර විසිනි.
(4) ඊ. ඒ. දෙල්වල විසිනි.
(5) සරත් විජේවර්ධන විසිනි. (.........)

● අංක **26** සිට **35** තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචන/වචනය යොදන්න.

**26.** දක්ෂිණ භාරතයේ පුද පූජාවලදී චක්කියාර් බ්‍රහ්මණයන් රඟදක්වන ලද්දේ .................................... ය.

**27.** යම, වායු, කාල සහ මූර්තු යනු බලි ශාන්තිකර්මයේ එන .................................... ට අයත් ගායනා විශේෂයකි.

**28.** ශ්‍රී ලංකාවේ ගොඩනගන ලද ප්‍රථම අංගසම්පූර්ණ ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව .................................... රඟහලයි.

**29.** කහරොටි පිදීම හා මී කැඩීම යන අංග අයත් වන්නේ .................................... ශාන්තිකර්මයට ය.

**30.** භරත නාට්‍යම් රංගනයක ශබ්දම් හා වර්ණම් යන නර්තනාංග .................................... ගණයට අයත් වේ.

**31.** පන්තේරුව රංග භාණ්ඩය ලෙස යොදාගෙන බුදුගුණ වයමින් සිදු කරනු ලබන නෘත්‍ය පූජෝපහාරය .................................... නමින් හඳුන්වනු ලැබේ.

**32.** මල් මඩුව හෙවත් නවමල්පාය, .................................... ශාන්තිකර්මයට අයත් සැරසිල්ලකි.

**33.** ස්වාභාවික හෙවත් .................................... නාට්‍ය ලෙස ලෝක ධර්මී නාට්‍ය හඳුන්වනු ලබයි.

**34.** ස්ථායී භාව අවදි කිරීමට මුල්වන හේතුව .................................... යනුවෙන් හැඳින්වේ.

**35.** කවි පදයක හෝ බෙර පදයක හෝ ලඝු, ගුරු මාත්‍රාවල එකතුව .................................... නම් වේ.

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** පහන් මඩුවේ ආරම්භක යක්කම සහ එහිදී ප්‍රධාන ඇදුරා විසින් දවුල් වාදකයාට පිළිගන්වන ද්‍රව්‍ය නම් කරන්න.

(i) යක්කම : ........................................

(ii) ද්‍රව්‍ය : ........................................

**37.** පහත දැක්වෙන ගීත ඇතුළත් මුද්‍රා නාට්‍ය නම් කරන්න.

(i) ඈත කඳුකර හිමවු අරණේ : ........................................

(ii) ජීවිතයත් මුහුද වගේ : ........................................

**38.** දේශීය මුද්‍රා නාට්‍ය සහ අපරදිග මුද්‍රා නාට්‍ය හඳුන්වන පර්යාය නාම ලියා දක්වන්න.

(i) දේශීය මුද්‍රා නාට්‍ය : ........................................

(ii) අපරදිග මුද්‍රා නාට්‍ය : ........................................

**39.** රාජා කර්තා රජු සම්බන්ධ නර්තන සම්ප්‍රදාය සහ එහි පූජෝපහාරයට ලක්වන දේව සංකල්පය සඳහන් කරන්න.

(i) නර්තන සම්ප්‍රදාය : ........................................


(ii) දේව සංකල්පය : ........................................

**40.** හංසවිල මුද්‍රා නාට්‍යයේ කුමරා සහ කුමරිය යන ප්‍රධාන චරිත හඳුන්වන නම් ලියන්න.


(i) කුමරා : ........................................

(ii) කුමරිය : ........................................

**41.** පහත **A** සහ **B** රූපයන්හි දැක්වෙන රංග භාණ්ඩ නම් කරන්න.



**A**



**B**

(i) **A** : ........................................

(ii) **B** : ........................................

**42.** වේදිකාව විවිධ තල සඳහා යොදාගත හැකි පරිද්දෙන්, නවීන තාක්ෂණය යොදාගෙන ශ්‍රී ලංකාවේ ඉදිකරන ලද ප්‍රථම රඟහල සහ එය පිහිටි නගරය ලියා දක්වන්න.

(i) රඟහල : ........................................

(ii) නගරය : ........................................

**43.** අද්‍යතන වේදිකාවේ නර්තන නිර්මාණකරණයේදී ගායනය හැර, නාද සංකලනය සඳහා එකතුවන කලා අංග **දෙකක්** ලියා දක්වන්න.

(i) ........................................................

(ii) ........................................................



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**44.** තම්මැට්ටම හෙවත් පොකුරු බෙරයේ වම් පස සහ දකුණු පස හඳුන්වන නම් ලියා දක්වන්න.

(i) වම් පස : ........................................

(ii) දකුණු පස : ........................................

**45.** දාදරා සහ ජප්තාල් යන හින්දුස්ථානි තාලවලට සමාන දේශීය තාල හඳුන්වන පාරිභාෂික නාම ලියන්න.

(i) දාදරා : ........................................

(ii) ජප්තාල් : ........................................

**46.** අනේ මී මැස්සේ...... කවිය අයත් නර්තනය සහ එය ගායනා කරනු ලබන සාම්ප්‍රදායික තාලරූපය ලියන්න.

(i) නර්තනය : ........................................


(ii) තාලරූපය : ........................................

**47.** බලියේ ස්වභාවය පිළිබඳ විස්තර කෙරෙන කවි සහ ආතුර ශරීර දොස් දුරු කිරීමට ගැයෙන කවි හඳුන්වන නම් පිළිවෙළින් දක්වන්න.


(i) ........................................ කවි

(ii) ........................................ කවි

**48.** පහත සඳහන් **A** සහ **B** රූපවල දැක්වෙන ශාන්තිකර්ම සැරසිලි නම් කරන්න.



**A**



**B**

(i) **A** : ........................................

(ii) **B** : ........................................

**49.** කළු යකාගේ චරිත නිරූපණයෙන් ප්‍රතීයමාන රස **දෙකක්** නම් කරන්න.

(i) ........................................ රසය

(ii) ........................................ රසය

**50.** හිස වෙස් තැබීමේ මංගල්‍යයේදී පළමුව සහ දෙවනුව පලඳිනු ලබන ශීර්ෂාභරණ **දෙක** පිළිවෙළින් දක්වන්න.

(i) ....................................................

(ii) ....................................................

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

12746

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

| | | | |
|---|---|---|---|
| **නර්තනය** | - | **(දේශීය)** | **II** |
| நடனம் | - | (தேசிய) | **II** |
| Dancing | - | (Indigenous) | **II** |

**52 S II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන මහ තනිතිතට අනුව සමගුණ, දෙගුණ සහ සිව්ගුණට ප්‍රස්තාර කරන්න.

(අ) තරිකිට

(ආ) කිටිතක

(ii) පහත සඳහන් කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මහ තනිතිතට අනුව ප්‍රස්තාර කරන්න.

"නොමදින් විකුම් පාලා සැදෙමින් යුදට ජය ලන්දෙසින් සම්දුන් එ ජනරාලා"

(iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ නළුගීතිකා තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ නාග ගජගා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** ප්‍රාථමික යුගයේ සිට මානවයාගේ ඇදහිලි-විශ්වාස සහ සමාජ අවශ්‍යතාවන් නර්තනය විධිමත් ලෙස සංවර්ධනය වීමට හේතු වී ඇත.

(i) ආදි මානවයාගේ අභිචාර විධි **දෙකක්** ඇසුරෙන් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ස්වභාවය, විදේශිකයින්ගේ වාර්තා **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) ක්‍රි. ව. 1950 – ක්‍රි. ව. 1970 කාල පරිච්ඡේදයේදී නර්තන කලාවේ ප්‍රගමනය පිළිබඳව සාධක **හතරක්** ඇසුරෙන් පහදන්න.

## II කොටස

**3.** ඇදහිලි-විශ්වාස මත පදනම් වූ ශාන්තිකර්ම මගින් තත් කාලීන සමාජ සංස්කෘතික පසුබිම පිළිබිඹු වේ.

(i) වලියක් මංගල්‍යය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) කිරිමඩුව ශාන්තිකර්මයේ කිරි ඉතිරවීම සහ නුගේ හැල්ල වෙනුවෙන් ඉදිකෙරෙන සැරසිලි **දෙක** විස්තර කරන්න.

(iii) රටයකුම ශාන්තිකර්මය උපදේශන ක්‍රියාවලියකි. නානුමුරය හා දරුනැළවිල්ල ඇසුරෙන් සාකච්ඡා කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**4.** රෝග නිවාරණයට බලපාන මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවේද ලෙස ශාන්තිකර්මයන්හි ගායන, වාදන සහ පසුබිම් අලංකරණ යොදාගෙන තිබේ.

(i) බලි ශාන්තිකර්මයේ ග්‍රහයන් **තිදෙනෙකුට** හිමි වර්ණ නම් කර එම වර්ණ සකස් කරගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) සන්නි යකුමේ රංගනය තීව්‍ර කිරීම සඳහා බෙරවාදකයාගේ දායකත්වය විස්තර කරන්න.

(iii) කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්ම අතුරෙන් **එකක්** තෝරාගෙන ඒ ආශ්‍රිත සැරසිලි විශේෂතා **හතරක්** විමසුමට ලක් කරන්න.

**5.** (i) ලී කෙළි සහ කෝලාට්ටම්, කුලු සහ සුලකු, කළගෙඩි සහ වෙම්බු යන සිංහල සහ දෙමළ ගැමි නැටුම්වල වෙනස්කම් දැකිය හැකි ය. විස්තර කරන්න.

(ii) පොත්කඩේ යක්කමෙහි නිරූපිත සමාජ සාරධර්ම **තුනක්** පැහැදිලි කරන්න.

(iii) පහත දැක්වෙන කරුණු ඇසුරෙන් රීරි යක් සහ ජස චරිතවල වෙනස්කම් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

(අ) ගායන, වාදන, නර්තන

(ආ) රංග වස්ත්‍රාභරණ

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ජතිස්වරම් | ශාප්මෝචන් | මහා පීටර් |
| පදම් | ලෝමහංස | චෛකොව්ස්කි |
| ආමද් | පටාචාරා | III හෙන්රි |
| තෝඩායම් | චිත්‍රාංගදා | ජෝර්ජ් නොවැර් |

(i) **(අ)** කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගය තෝරාගෙන විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - දේශීය මුද්‍රා නාට්‍ය කෘතිය තෝරාගෙන එහි රංග රචනය විමසන්න.

(iii) **(ඉ)** කොටස - හංසවිල බැලේ නාට්‍යයේ සංගීත ශිල්පියා හඳුනාගෙන ඔහුගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

**7.** ශ්‍රී ලාංකේය නර්තනාංග ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේදී දේශීය අනන්‍ය ලක්ෂණ ආරක්ෂා කරගැනීම වැදගත් වේ.

(i) බැරිසිල් කලා කෘතියේ චරිත නිරූපණයේ දැකිය හැකි උපහාසාත්මක ලක්ෂණ පැහැදිලි කරන්න.

(ii) නර්තන කලාවේ නූතන ප්‍රවණතා සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි බලපාන ආකාරය නර්තන රචනය සහ රංග වස්ත්‍රාභරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) රියැලිටි තරග පැවැත්වීම මගින් දේශීය නර්තනයට සිදුවිය හැකි අයහපත වලක්වා ගැනීම සඳහා උචිත යෝජනා **හතරක්** සාකච්ඡා කරන්න.

**8.** නූතන තාක්ෂණික මෙවලම් භාවිතය නිසා නර්තන කලාව ජනප්‍රියත්වයට පත්ව තිබේ.

(i) අංගරචනය හා රංග වස්ත්‍රාභරණ නිර්මාණ ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ii) රංගාලෝකකරණය හා ශබ්ද පරිපාලනය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමසුමට ලක් කරන්න.

(iii) සාම්ප්‍රදායික රඟමඩලේ නර්තනාංග සහ ප්‍රාසංගික වේදිකාවේ නිර්මාණ සංසන්දනය කරමින් ඉහත ප්‍රකාශය විචාරයට ලක් කරන්න.

***

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/